**ශීර්ෂය 281 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 281 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජුලි 31 දින දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 8,583.40 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 7,590.32 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 993.08 ක් හෙවත් සියයට 11.57 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 6,920.40 | 6,676.10 | 244.30 | 3.53 |
| මූලධන | 1,663.00 | 914.22 | 748.78 | 45.03 |
| **එකතුව** | **8,583.40** | **7,590.32** | **993.08** | **11.57** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහාදෙපාර්තමේන්තුව වෙත වෙනත් අමාත්‍යාංශ 02 ක් හා දෙපාර්තමේන්තු 02 ක් විසින් එකතුව රු.මිලියන 2,476.82ක ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,073.22ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 1,403.61 ක් හෙවත් සියයට 56.66 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 28101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 250.00 | 206.56 | 192.00 | 226.22 | 600.00 | 357.34 |

## 2.3 අග්‍රිම ගිණුම

2016 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 1.77 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 07 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 418.22ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු.මිලියන** |
| 6000/0000/00/0006/0051/000 | 168.06 |
| 6000/0000/00/0002/0010/000 | 10.78 |
| 6000/0000/00/0001/0010/000 | 0.01 |
| 6000/0000/00/0013/0024/000 | 1.31 |
| 6000/0000/00/0018/0011/000 | 6.89 |
| 6000/0000/00/0016/0009/000 | 139.41 |
| 6000/0000/00/0013/0032/000 | 91.76 |
| **එකතුව** | **418.22** |

## 2.5 විගණන නිරීක්ෂණය

---------------------

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

------------------------------------------------

## 3.1 ගිණුම් ඉදිරිපත් කිරීම

---------------------

දෙපාර්තමේන්තුව විසින් ගොවිජන සේවා මධ්‍යස්ථාන විසින් පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශන 2017 පෙබරවාරි 28 දින වන විට විගණනයට ඉදිරිපත් කළ යුතුව තිබුණි. ඒ අනුව මුළු ගොවිජන සේවා මධ්‍යස්ථාන 560 න් 2016 වර්ෂය වෙනුවෙන් ගොවිජන සේවා මධ්‍යස්ථාන 77 ක මූල්‍ය ප්‍රකාශන නියමිත දිනයට ඉදිරිපත් කර නොතිබුණි. ඉකුත් වර්ෂවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණු මධ්‍යස්ථාන හා එම මධ්‍යස්ථානවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිමේ ප්‍රගතිය පිළිපිඹු වන පරිදි ප්‍රගති වාර්තා දෙපාර්තමේන්තුව විසින් පවත්වා නොතිබුණි. වර්ෂ අනුව විගණනයට ඉදිරිපත් නොකළ මූල්‍ය ප්‍රකාශන ගණන පහත දැක්වේ.

| **වර්ෂය** | **ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව** |
|---|---|
| 2006 | 36 |
| 2007 | 34 |
| 2008 | 31 |
| 2009 | 25 |
| 2010 | 12 |
| 2011 | 10 |
| 2012 | 13 |
| 2013 | 18 |
| 2014 | 26 |
| 2015 | 33 |
| 2016 | 77 |
| **එකතුව** | **315** |

## 3.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

---------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීන කර පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| | --------------- | ------------------ |
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (iii) | උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 |
| (iv) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |
| (v) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |
| (vi) | වාහන ලැයිස්තු ගත කිරිමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) |

**3.3 පොදු තැන්පත් ගිණුම**

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව යටතේ පවත්වා ගෙන යනු ලබන තැන්පත් ගිණුම්වල දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව ශේෂය අතර වෙනස්කම් අනාවරණය වී තිබුණත්, එම වෙනස්වීම් මුදල් රෙගුලාසි 427 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සසඳා නොතිබුණි.

(ආ) වර්ෂ 02 ක් ඉක්මවූ එකතුව රු.167,213 ක්වූ තැන්පතු 03 ක් හා අනුරාධපුරය ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයේ රු.1,675,994 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

-----------------------------------------

විෂය අංක 28101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.23,766,309 ක් වී තිබුණි. එම හිඟහිටි ණය ශේෂවලින් වර්ෂ 1 ක සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට පැවත එන රු.18,664,628 ක්ද, වර්ෂ 7 කට වැඩි කාලයක සිට පැවැත එන පළාත් සභාවලට අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.486,994 ක්ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව පාලන ගිණුමේ ශේෂය සමඟ සැසඳීමේදී රු.1,929,786 ක වෙනසක් නිරීක්ෂණය විය. එම වෙනසට හේතු සොයා බලා නිවැරදි කිරීමට 2017 අගෝස්තු 31 දින වන විටත් දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු වර්ෂ 7 කට වැඩි කාලයක සිට පැවැත එන රු.2,968,933 ක ණය ශේෂ 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර එම අදාළ ස්ථාන මාරුවීම් ලබා ගිය ආයතනවලින් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 3.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---------------------------------------

### 3.5.1 වාර්ෂික ක්‍රියකාරි සැලැස්ම

------------------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කළ ක්‍රියාකාරී සැලැස්මේ කුඩා වැව් හා ඇළ මාර්ග පුනරුත්ථාපනය සඳහා රු.මිලියන 2,000 ක්ද, සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය හා පුරන්කුඹුරු අස්වැද්දවීමේ වැඩසටහන යටතේ රු.මිලියන 1,320 ක්ද වශයෙන් ප්‍රතිපාදන සලසා තිබුණු අතර, දෙපාර්තමේන්තුව විසින් පුනරුත්ථාපනය කළ යුතු වැව් හා ඇළ මාර්ග හඳුනා ගෙන නොතිබුණි.

### 3.5.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වසරක් පාසා පවත්වනු ලබන අළුත් සහල් මංගල්‍යය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය, උපකරණ ඇතුළු සමස්ත සැපයුම් වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර ප්‍රසම්පාදන පරිපාටි අනුගමනය කරමින් මිලදී ගැනීමට කටයුතු කළ යුතුව තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේදී අනුරාධපුර ගොවිජන දිස්ත්‍රික් කාර්යාලය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය නොකර රු.2,000,000 ප්‍රසම්පාදනයන් සිදුකර තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6 මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත් සඳහා රඳවා තබා ගත් මුදල්, දෝෂ වගකීම් කාල සිමාව අවසන් වූ වහාම කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු වුවත්, 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ කොන්ත්‍රාත් 14 කට අදාළව රු.547,071 ක රඳවා ගත් මුදල් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය ජයවැව කෘෂිමාර්ගය බොරළු දමා සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත්තුව සහ මහනුවර දිස්ත්‍රික්කයේ තවත් ව්‍යාපෘති 10 ක් ඉටු කිරිම සඳහා පිළිවෙලින් රු.970,817 ක් හා රු.8,857,465 ක්වු කොන්ත්‍රාත් සඳහා ගිවිසුම්වලට එළඹ තිබුණි. නමුත් එම කොන්ත්‍රාත් ගිවිසුම්වල 17 වගන්තියට පටහැනිව උපකොන්ත්‍රාත්තු ලබා දී තිබුණි.

### 3.5.3 අභ්‍යන්තර විගණනය

විගණන සැලැස්මට අනුව ප්‍රධාන කාර්යාලයේ ආයතනික කටයුතු, ප්‍රසම්පාදන, ඉදිකිරීම් හා අලුත්වැඩියා සඳහා විගණන වැඩසටහන් 13 ක් ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඉන් එක් වැඩසටහනක් විගණනය කර තිබුණු අතර ගොවිජන සේවා මධ්‍යස්ථාන හා ගොවි බැංකු නියමු ව්‍යාපෘති වෙනුවෙන් විගණන වැඩසටහන් පිළිවෙලින් 144 ක් හා 72 ක් ඉටු කිරීමට සැලැසුම් කර තිබුණත්, ඉන් විගණන වැඩසටහන් පිළිවෙලින් 77 ක් හා 34 ක් පමණක් ඉටු කර තිබුණු අතර විශේෂ පරීක්ෂණ 24 ක් පවත්වා තිබුණි.

### 3.5.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පිළියෙල කර පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2015 හා 2016 වාර්තා 2017 ජුලි 18 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 3.6 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

නියැදි විගණන පරීක්ෂණයට අනුව නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති වත්කම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

(i) ගොවිජන සේවා මධ්‍යස්ථානවල නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති වත්කම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ගොවිජන සේවා මධ්‍යස්ථානය | වත්කම් වර්ගය | ප්‍රමාණය | වටිනාකම | ඌන උපයෝජිතව පැවැති කාලය |
|---|---|---|---|---|
| | | | රු. | |
| දඹගල්ල | කුබෝටා ට්‍රැක්ටරය සහ ට්‍රේලරය | 01 | - | වර්ෂ 17 |
| කතරගම, සෙවනගල හා බුත්තල | බීජ හා කෘෂි නිෂ්පාදන අලෙවිසැල් | 03 | - | වර්ෂ 03 |
| බුත්තල | කෘෂි යන්ත්‍ර | 02 | 5,682,000 | වර්ෂ 03 |

| | | | |
|---|---|---|---|
| මාලබේ | ප්‍රයිමුවර් යන්ත්‍රය | 01 | වර්ෂ 02 |

(ii) බුත්තල ගොවිජන සේවා මධ්‍යස්ථානය සතු රු.2,311,224 වටිනා අක්‍රීය ට්‍රැක්ටර් රථ 03 ක් හා ට්‍රැක්ටර් ට්‍රේලරයක් අපහරණය කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(iii) දිස්ත්‍රික් කාර්යාල 19 ක රෝද 04 ට්‍රැක්ටර් 320 ක්ද, රෝද 02 ට්‍රැක්ටර් 72 ක්ද, ට්‍රේලර් 136 ක් සහ ඊට අදාළ උපකරණ කට්ටල් සමඟ වර්ෂ 3 කට වැඩි කාලයක සිට නිෂ්ක්‍රීයව පැවැතුණි.

(iv) දිස්ත්‍රික්ක 05 ක් සඳහා ලබාදී තිබූ ඩෝසර් යන්ත්‍ර 50 ක් 2016 දෙසැම්බර් 31 වන විට ඉන් 14 ක් අක්‍රීයව පැවැතුණු අතර යන්ත්‍ර 07 ක් වර්ෂය තුළ නිෂ්කාර්යව පැවතුණි.

(v) දෙපාර්තමේන්තුව සතු රජයේ නිවාස 155 ක් වූ අතර එයින් නිවාස 54 ක් අළුත්වැඩියා කළ යුතු හා අබලන් තත්ත්වයේ පැවැති අතර නිවාස 44 ක් නිෂ්කාර්යව පැවතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**---------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් කාර්යාල 07 කට අදාළව 2016 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2017 ජුලි 14 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. 2004 ඔක්තෝබර් 14 දිනැති අංක 174 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව වත්කම් 80 කට අදාල සංකේතාංක දක්වා නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව සතු බුල්ඩෝසර් යන්ත්‍ර පිළිබඳ සමීක්ෂණ මණ්ඩල වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබුණු වත්කම්**

**---------------------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් වාහන 03 ක් වෙනත් ආයතන වෙත මුදාහැර තිබුණි.

**(ඈ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

**-----------------------------------------------------------------**

වෙනත් දෙපාර්තමේන්තු හා ආයතනවලින් ලබාදී තිබුණ වාහන 12 ක් විධිමත් පරිදි පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. ජීප් රථය ලෝක ආහාර ව්‍යාපෘතිය මඟින් දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණත්, එම වාහනය ලියාපදිංචි නොකර භාවිතයකින් තොරව ගාල්කර තිබුණි.

**3.7 අනුකූල නොවීම්**

**------------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**---------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | |
| **2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ** | |
| (i) 51(1) වගන්තිය | ගොවිජන සංවර්ධන සභාව සහ ගොවිජන කේන්ද්‍රය ස්ථාපනය කර නොතිබුණි. |
| (ii) 53(1) වගන්තිය | කෘෂිකාර්මික ඉඩම් පිළිබඳ සංශෝධනය සහ ප්‍රතිශෝධනය කර නොතිබුණු අවස්ථා ගොවිජන සේවා මධ්‍යස්ථාන නියැදි විගණන පරීක්ෂාවලදී නිරීක්ෂණය විය. |
| (iii) 81(2) වගන්තිය | වාරි කර්මාන්ත අධීක්ෂණය කිරීම සහ පරිපාලනය කිරීම ගොවි සංවිධාන යටතට පත් කිරීම සම්බන්ධයෙන් නියෝග සාදා නොතිබුණි. |
| (iv) 56 (3) හා (4) වගන්තිය | අක්කර බදු ගෙවීම පැහැර හරින්නන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 | මාණ්ඩලික නිලධාරියෙකු වෙත එක් අවස්ථාවකදී ලබා දිය හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය රු.100,000 ක් වුවත්, එම සීමාව ඉක්මවා අවස්ථා 04 කදී රු.200,000 ක සිට රු.1,000,000 ක් දක්වා පරාසයක ප්‍රමාණවලින් අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.<br><br>මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කාර්යය නිම කර දින 10 ක් ඇතුළත ලබා ගත් තත් කාර්ය අතුරු අග්‍රිමය පියවිය යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබුණු තත් කාර්ය අතුරු අග්‍රිමවලින් එකතුව රු.1,664,064 ක වියදම් පියවීමට දින 25 ක |

සිට දින 117 ක් දක්වා පරාසයක කාල පමාවක් සිදු කර තිබුණි. එම අග්‍රිමවලින් වියදම් නොකළ ඉතිරි වූ මුදල් පියවීමට දින 61 ක සිට දින 115 ක් දක්වා පරාසයක කාල පමාවක් සිදු කර තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 396(ඈ)

දිස්ත්‍රික් කාර්යාල බැංකු ගිණුම් 17 ක හා ප්‍රධාන කාර්යාල බැංකු ගිණුමෙහි 2016 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06 ක කාලයක් ඉක්මවූ රු.1,297,701 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iii) මුදල් රෙගුලාසි 756(3)

ගොවිජන සේවා මධ්‍යස්ථානවල වර්ෂ 5 කට වඩා දිර්ඝ කාලයක සිට පැවත එන ප්‍රයෝජනයට ගත නොහැකි / කල් ඉකුත් වූ පොහොර, කෘෂි රසායන බීජ හා කෘෂි උපකරණ තොග සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ඇ) ගොවිජන සංවර්ධන ජනරාල්ගේ චක්‍රලේඛ**

**-------------------------------------**

(i) 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන (ගොවි බැංකු) චක්‍රලේඛය

- 3.4.2 ඡේදය

කෘෂිකාර්මික ණය පියවීම මාස 6 ක උපරිම කාල සීමාවකදී සිදු කළ වුවද, 1998 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ලබා දී තිබූ ණය වලින් රු.220,356,822 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් හිඟහිටව පැවතිණි. ඉන් රු.98,707,370 ක් වර්ෂ 5 කට වැඩි කාලයක් සිට හිඟහිටව පැවත එමින් තිබුණි.

- 4.4.2 ඡේදය

ගොවිජන බැංකුවට ලබාදී තිබුණු ප්‍රාග්ධන මුදල් වර්ෂ 05 ක් තුළ ආපසු ගෙවිය යුතු වුවත්, 2016 දෙසැම්බර් 31 දිනට ගොවි බැංකු 236 ක් විසින් ආපසු නොගෙවූ හිඟ ප්‍රාග්ධන මුදල රු.253,404,346 ක් විය.

(ii) 2016 ජනවාරි 07 දිනැති අංක 01/2016 දරන චක්‍රලේඛය

සමාලෝචිත වර්ෂයේ මහනුවර දිස්ත්‍රික්කය තුළ ඉටුකරන ලද සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති 27 ක් වෙනුවෙන් ප්‍රතිපාදන අධි ඇස්තමේන්තු කිරීම් නිසා ලබා ගත් ප්‍රතිපාදනවලින් සියයට 34 ක සිට සියයට 86 ක් දක්වා පරාසයක ප්‍රමාණයක ඉතිරිවීම් පැවැතුණි.

චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නිර්නායකයන් අනුව ව්‍යාපෘති ප්‍රමුඛතා ගත කිරීම සිදු කර නොතිබුණි.

නියම කරන ලද කාලරාමුව තුළ ව්‍යාපෘති හඳුනා ගැනීම, ඇස්තමේන්තු සකස් කිරීම, ව්‍යාපෘති ආරම්භ කිරීම හා අවසන් කිරීම හා ව්‍යාපෘති පසු විපරම් කටයුතු සිදු කිරීම කළ යුතු වුවත්, එසේ කර නොතිබුණි.

| | | |
|---|---|---|
| (iii) | 2016 නොවැම්බර් 29 දිනැති අංක 7/13/L/1(v) දරන ලිපියේ 02 ඡේදය | සුළු වාර්මාර්ග ඉදිකිරීම සඳහා අවසන් ගෙවීම සිදු කිරීමට ප්‍රථම කොන්ක්‍රීට් වැඩ ප්‍රමාණය සහ දිග මීටර් 35 ක් ඉක්මවන වාර්මාර්ග ඉදිකිරීම් අවස්ථාවලදී මාළඹේ පිහිටි තත්ත්ව පාලනාගාරයෙන් අදාළ තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබා ගෙන නොතිබුණි. |

**(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**

------------------------------------

| | |
|---|---|
| 2.4.1 මාර්ගෝපදේශය | දඹගල්ල ගොවිජන සේවා මධ්‍යස්ථානය සඳහා අවස්ථා 05 කදී එකතුව රු.486,276 ක් වටිනා පරිගණක උපකරණ මිලදී ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර එහි අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |

## 3.8 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

-----------------------------------------------------

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අතහැර දැමීම**

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේදී කෑගල්ල දිස්ත්‍රික්කයේ සුළු වාර්මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘති 04 ක් සඳහා එකතුව රු.4,042,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද, 2017 පෙබරවාරි 14 දින වන විට එම ප්‍රතිපාදන උපයෝගී කර ගෙන කිසිදු ව්‍යාපෘතියක් ආරම්භ කර නොතිබුණි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉටු කිරීමට අනුමත කර තිබුණු එකතුව රු.මිලියන 122.54 ක්වූ ව්‍යාපෘති 15 ක් සමාලෝචිත වර්ෂයේදී ඉටු නොකර අතහැර තිබුණි.

(ii) කුඩා වැව් හා ඇළ මාර්ග ප්‍රතිසංස්කරණ වැඩසටහන් යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගිවිසුම්ගත වටිනාකම රු.මිලියන 11.70 ක්වූ ව්‍යාපෘති 06 ක් නිම කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) නියමිත දිනට නිම නොවූ ව්‍යාපෘති**

**-----------------------------------**

රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට ඒදණ්ඩවල වේල්ල හා කොලොන්න මහවෙල වේල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පිළිවෙලින් රු.688,179 කට හා රු.846,062 කට ගිවිසුම්වලට එළඹ තිබූ අතර ගිවිසුම් ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ එම ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් නොකිරීම නිසා ප්‍රතිලාභීන් 421 කට ලබා ගත හැකිව තිබුණු ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

**(ඇ) ප්‍රගතියක් ලබා ගෙන නොතිබුණු වැඩ විෂයයන්**

**-----------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ මාලිගාතැන්න වැව ප්‍රතිසංස්කරණය කිරීමේ ඇස්තමේන්තුව ප්‍රකාරව එම වැඩවල වටිනාකම රු.4,331,025 ක් වී තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදුකළ භෞතික විගණන පරීක්ෂාවේදී ගොවි පවුල් 15 ක් පදිංචි වී සිටින මාලිගාතැන්න වැව ආශ්‍රිතව වගාකළ හැකි කුඹුරු අක්කර 15 ක් වූ අතර 2017 අප්‍රේල් මාසය වන විටත් කිසිදු වගා කටයුත්තක් සිදුකර නොතිබුණි.

(ii) මහනුවර දිස්ත්‍රික්කයේ සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කරන ව්‍යාපෘති 05 ක් වෙනුවෙන් රු.3,903,520 ක් වැය කර තිබුණි. 2017 ජුනි මාසය දක්වා එම ඇල මාර්ග ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. එම ව්‍යාපෘති මගින් අස්වැද්දීමට බලාපොරොත්තු වූ කුඹුරු කිසිවක් අස්වැද්දීම සිදුකර නොතිබුණි.

(iii) 2010, 2013, 2015 හා 2016 වර්ෂවල මාතලේ හා මහනුවර දිස්ත්‍රික්කවල සිදු කරන ලද සුළු වාර්මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු නිසි පරිදි සිදු නොකිරීම හේතුවෙන් ඇළ මාර්ගවලින් අපේක්ෂිත ප්‍රයෝජනයන් ගැනීමට නොහැකි වී තිබුණි.

**(ඈ) ව්‍යාපෘතිය මගින් පරිසරයට වන බලපෑම**

**------------------------------------------**

ඔරුවල ලන්ද වැව ප්‍රතිසංස්කරණය කිරීමේ දී වැව අසල පිහිටි කඳු ගැටය ඉවත් කිරීම සම්බන්ධයෙන් ඇති විය හැකි පාරිසරික හා ජෛව හානිය පිළිබඳව හා හුනියන්ගල වැව ආශ්‍රිතව සිදුවී ඇති පාරිසරික හානිය පිළිබඳව පාරිසරික ඇගයීම් වාර්තාවක් ලබා ගෙන නොතිබුණි.

**3.9 කාර්යසාධනය**

**------------------**

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) **ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

---------------------------------------------

2015 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීමේ වැඩසටහන යටතේ කෘෂි උද්‍යාන ව්‍යාපෘතිය සඳහා රත්නපුර දිස්ත්‍රික්කයේ රු.15,041,113 ක් වැය කර තිබුණි. ව්‍යාපෘතිය සඳහා ලබාදුන් ප්‍රතිපාදන වෙනත් කාර්යයන් සඳහා වැය කිරීම, ගොවිජන සේවා මධ්‍යස්ථාන භූමිය ක්‍රමානුකූලව සැලැසුම් කළ ආකාරයට ඉදිකර නොතිබීම, ප්‍රාදේශීය කෘෂි දේශගුණික කළාප අනුව භෝග තෝරා නොගැනීම සහ භූමිය නඩත්තු කිරීම සඳහා ශ්‍රමිකයින්ගේ ඌණතාවයන් සිදු වී තිබුණු බව නිරීක්ෂණය විය.

**(ආ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

-------------------------------------------------------

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ඉටු කර නොතිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) ගොවිජන සේවා මධ්‍යස්ථාන විධිමත් අධීක්ෂණය තුළින් ඵලදායීතාවය වැඩි දියුණු කිරීම සඳහා වාර්තා 532 ක් ලබා ගැනීමට ඉලක්ක කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී පරීක්ෂණ වාර්තා 435 ක් පමණක් ලබාගෙන තිබුණි.

(ii) බුත්තල හා කතරගම ගොවිජන සේවා මධ්‍යස්ථාන කුඩා කෘෂිකාර්මික උද්‍යානයක් ලෙස වැඩි දියුණු කිරීමේ වැඩසටහන යටතේ හඳුන්වා දුන් ක්‍රියාකාරකම් සඳහා වැය නොකර වෙනත් අවශ්‍යතාවයන් සඳහා පිළිවෙලින් රු.335,738 ක් හා රු.78,400 ක් යොදවා තිබුණි.

**(ඇ) සැලසුම් කිරීම**

---------------

වාර්ෂික ක්‍රියකාරි සැලැස්මට අනුව කටයුතු නොකළ අවස්ථා පැවති අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සුළු වාරිමාර්ග හා පුරන්කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන යටතේ අමුණු 239 හා වාරි ඇළ මාර්ග 457 ක් ඉදිකිරිමට සැලැසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී අමුණු 98 ක් හා වාරි ඇළ මාර්ග 243 ක් පමණක් ඉදිකර තිබුණි. පුරන් කුඹුරු 30,000 ක් අළුතෙන් වගා කිරීමට සැලැසුම් කර තිබුණද, අස්වද්දා තිබූ කුඹුරු ප්‍රමාණය අක්කර 5950 ක් වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී බෝග විවිධාංගීකරණ වැඩසටහන යටතේ රු. මිලියන 50 ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර, එම ප්‍රතිපාදන යොදවා ඉටුකිරීමට අපේක්ෂා කළ කාර්යයන්වල ප්‍රගතිය පහත පරිදි විය.

| ඉටු කිරීමට අපේක්ෂා කළ කාර්යයන් | සැලැසුම් කළ ව්‍යාපෘති සංඛ්‍යාව | ඉටු කළ ව්‍යාපෘති සංඛ්‍යාව | ඉටු නොකළ ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|
| ගංවතුර/කරදිය පාලන ජලාප්‍රවාහන පද්ධති වැඩිදියුණු කිරීම. | 41 | 18 | 23 |
| (ඇලිවැටි)සෝජාන් | 14 | 9 | 5 |
| සුළු වාරිමාර්ග | 143 | 67 | 76 |

## 3.10 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

### ගැලපුම් කළ යුතු ශේෂ

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2017 මැයි මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| ගැලපුම් පිළිබඳ විස්තරය | | කාල විශ්ලේෂණය | | | එකතුව |
|---|---|---|---|---|---|
| | | මාස 06 ට වැඩි වර්ෂ 01 ට අඩු | වර්ෂ 01 ට වැඩි 03 ට අඩු | වර්ෂ 03 ට වැඩි | |
| | | රු. | රු. | රු. | රු. |
| (i) | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් | 769,623 | 474,542 | 53,534 | 1,297,699 |
| (ii) | හඳුනා නොගත් හර | - | 308,579 | 4,200 | 312,779 |
| (iii) | හඳුනා නොගත් බැර | 20,293 | 374,572 | 3,198. | 398,063 |

## 3.11 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන යටතේ දෙපාර්තමේන්තුව වෙත 2014 වර්ෂයේදී රු. 3,500,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් බණ්ඩාරගම මැතිවරණ කොට්ඨාශයේ පිහිටි කෝරලේ ඇල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා එම ප්‍රතිපාදනය වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත නිදහස් කර තිබුණු අතර, 2017 ජුලි 20 දින වන විටද එම ප්‍රතිසංස්කරණ කටයුතු නිමකර නොතිබුණි.

(ආ) රජය විසින් සහනාධාර පොහොර බෙදාහැරීම නවතා තිබියදී දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික්ක 14 ක රු.44,977,339 වැයකර පොහොර ගබඩා 19 ක් ඉදිකිරීම සඳහා ප්‍රමුඛතාවය ලබා තිබුණි.

(ඇ) පළාත් පාලන ආයතන විසින් සංවර්ධනය කළ යුතු කෘෂිමාර්ග එම ආයතනයේ අනුමැතිය ලබානොගෙන දෙපාර්තමේන්තුව විසින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ කුංචුට්ටුව රළපනාව කෘෂිමාර්ගය රු.988,397 ක් වියදම් කර ප්‍රතිසංස්කරණය කර තිබුණි.

(ඈ) කාබනික පොහොර නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා "සාර ලංකා" ණය යෝජනා ක්‍රමය යටතේ දිස්ත්‍රික්ක 21 ක් සඳහා රු.50,000,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර දිස්ත්‍රික්ක 15 ක ගොවින් සඳහා රු.32,800,000 ක ණය මුදලක් ලබා දී තිබුණි. එම ණය මුදල් ලබා දුන් දින සිට මාස 6 කට පසුව මාසිකව අයකර ගත යුතුව තිබුණත්, 2017 අගෝස්තු 08 දින වන විට රු.199,213 ක් පමණක් අයකර ගෙන තිබුණු අතර එය ණය මුදලෙන් සියයට 0.6 ක ප්‍රමාණයක් විය.

**3.12 අනාර්ථික ගනුදෙනු**

---------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) රඹුක්පොත ගොවිජන සේවා මධ්‍යස්ථාන ගොඩනැගිල්ල රු.18,827,083 ක් වැය කර 2009 වර්ෂයේ ඉදිකිරීම ආරම්භ කර තිබුණි. එම ගොඩනැගිල්ල පිහිටි භූමියේ අස්ථාවරත්වය සම්බන්ධයෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ඉදිරිපත් කළ සමීක්ෂණ වාර්තාවේ ඇතුළත් නිර්දේශ නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම නිසා ගොඩනැගිල්ල ගිලා බැස තිබුණි. 2014 වර්ෂයේදි ඉදිකිරීම් කටයුතු නතර කර තිබුණ බව නිරීක්ෂණය වූ අතර මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) රත්නපුර ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය කුලී පදනම මත ලබා ගත් ගොඩනැගිල්ලක පවත්වා ගෙන යනු ලබන අතර එම කාර්යාලයට අයත් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව කොන්ත්‍රාත්කරු විසින් නියමිත දිනට ඉදි කර භාර දීම පැහැර හැරීම නිසා ගොඩනැගිලි කුලී රු.960,000 ක් ගෙවීමට සිදු වී තිබුණි.

(ඇ) සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතින් ප්‍රමුඛතා ගත නිර්නායක අනුව වාරි කර්මාන්තය යටතේ අවම ප්‍රතිලාභි පවුල් 10 ක් සිටිය යුතු වුවත්, මහනුවර දිස්ත්‍රිකයේ ප්‍රතිලාභි පවුල් 10 කට වඩා අඩු ව්‍යාපෘති 11 ක් සඳහා රු.6,301,706 ක් වියදම් කර තිබුණි.

**3.13 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

-----------------------------------------

කැකිරාව ප්‍රාදේශිය සංවර්ධන බැංකුවේ තැන්පත් කර තිබු රු.450,000 ක ස්ථාවර තැන්පතු මුදල හිටපු ප්‍රාදේශිය නිලධාරියා පෞද්ගලික ගිණුමට 2011 අගෝස්තු මාසයේදී බැර කර තිබුණු අතර අදාළ නිලධාරියාගේ වැඩ තහනම් කර තිබුණද, එම මුදල් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය කර ගෙන නොතිබුණි.

**3.14 පාඩු හා හානි**

--------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) අනුරාධපුර මරදන්කඩවල ගොවිජන සේවා මධ්‍යස්ථානයේ හානි හා පාඩු ලේඛනයක් පවත්වා නොතිබූ අතර රු.1,111,970 ක පාඩුවක් හඳුනාගෙන තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව සතු වාහනයක් 2013 ජුලි 16 දින අනතුරට ලක්වී තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103, 104 හා 109 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.15 කළමනාකරණ දූර්වලතා**

-------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දූර්වලතා නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසන් වන විට වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට පැවැත එන මූලික විමර්ශන 26 ක් නිම කර නොතිබුණි.

(ආ) බලංගොඩ රත්මලවින්න ගොවිජන සේවා මධ්‍යස්ථානයෙහි සිදුවූ පොහොර වංචාවන් සම්බන්ධයෙන් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් 09 දෙනෙකු වෙනුවෙන් 2008 වර්ෂයේ දී ආරම්භ කළ මූලික විමර්ශන කටයුතු හා මුදල් රෙගුලාසි 104(ආ) ප්‍රකාර පරීක්ෂණ 2016 ජුලි 27 දින අවසන් කර තිබුණි. නමුත් ඊට අදාළ රු.1,667,250 වූ තොග ඌනතාවය විගණිත දිනය වූ 2017 ජුලි 12 දින වන විටත් අදාළ නිලධාරීන්ගෙන් අයකර ගෙන නොතිබුණි.

(ඇ) දිගන ගොවි බැංකු සම්බන්ධයෙන් කරන ලද මුදල් රෙගුලාසි 104(1)(ආ) ප්‍රකාර පරීක්ෂණය අනුව මුදල් අවභාවිතය සම්බන්ධයෙන් නිලධාරින් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,077,451ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඈ) විධිමත් විනය පරීක්ෂණවලට අනුව නිලධාරින් 7 දෙනෙකු ගෙන් අයවිය යුතු රු.517,200 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) බඩ ඉරිඟු වගා කරන ගොවීන් 5386 ක් සඳහා ණය ලබාදීමට 2015 වර්ෂයේදී ගොවීන්ගේ භාරකාර අරමුදලින් ලබා ගත් රු.80,790,000 ක කෙටිකාලීන ණය මුදලින් රු.36,280,143 ක් 2017 අගෝස්තු 08 දින වන විටත් පියවා නොතිබුණි.

(ඊ) චක්‍රීය අරමුදල මගින් ගොවීන් වෙත ලබා දුන් රු.91,654,083 කින් රු.9,962,027 ක් 2016 දෙසැම්බර් 31 වන විටත් අයකර ගෙන නොතිබුණි.

(උ) අනුරාධපුර ගොවිජන සේවා මධ්‍යස්ථානයේ නිලධාරීන් දෙදෙනෙකුගේ මූල්‍ය අක්‍රමිකතා නිසා සිදු වූ මූල්‍ය ඌනතාවය හා තොග ඌනතාවය රු.364,111 ක් වූ අතර එය වර්ෂ 07කට වැඩි කාලයක සිට පැවැත එමින් තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඌ) කුඹුරු ඉඩමක් වෙනත් කාර්යයක් සඳහා යොදවා ගැනීමට ලිඛිත අවසරය ලබාදීමේදී නිශ්චිත නෛතික විධිවිධානයක් භාවිතා කර නොතිබුණි.

## 3.16 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 123 | 74 | 49 |
| (ii) | තෘතියික මට්ටම | 645 | 485 | 160 |
| (iii) | ද්විතියික මට්ටම | 16,066 | 13,175 | 2,891 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 1,543 | 585 | 958 |
| | එකතුව | **18,377** | **14,319** | **4,058** |

මීට අමතරව උපාධිධාරී අභ්‍යාසලාභීන් 111ක් ද අනුයුක්ත කර තිබුණි.

### (ආ) වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් 08 දෙනෙක් වෙනත් පාර්ශවයන්ට මුදාහැර තිබුණු බව නිරීක්ෂණය විය.